www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුරුමයට කෙරෙන “මානුෂික” මැදිහත්වීමක ආධාරකරුවන්ට පිලිතුරක්

## A reply to supporters of "humanitarian" intervention into Burma

**පීටර් සිමන්ඩ්ස් විසිනි**

**2008 ජුනි 7**

“බුරුමයට ජාත්‍යන්තර මැදිහත්වීමක් සඳහා වන ප්‍රචාරක උද්ඝෝෂනය කුමක් අරබයා ද?” යන මැයෙන් යුත් අපගේ ලිපිය විවේචනය ලක් කෙරුනු විද්‍යුත් ලිපි ගනනාවක් ම *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වෙත ලැබී ඇත. බුරුම ජුන්ටාව විදේශ ආධාර නිලධාරින්ට හා විදේශ මිලිටරි හමුදාවල මානුෂික ආධාරවලට සිය රට විවෘත කල යුතු යයි ඉල්ලා සිටින ජාත්‍යන්තර මාධ්‍ය උද්ඝෝෂනයට සහාය දීම ප්‍රතික්ෂේප කිරීමේ අපගේ තීන්දුවට, එම ලිපි සියල්ල ම ඒ හෝ මේ ආකාරයෙන් විරුද්ධ වෙයි.

වඩා අවලාදාත්මක විද්‍යුත් ලිපි, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* බුරුම තන්ත්‍රයට සහයෝගය දෙන්නේ යයි චෝදනා කරන්නේ, වත්මන් ව්‍යසනය පිලිබඳව විභාග කරන අපගේ සෑම ලිපියක ම ජුන්ටාවට අප දක්වන විරුද්ධත්වය පැහැදිලි කර තිබීම ද නොතකා ය. කෙසේ වෙතත්, එම විවේචනවල කේන්ද්‍රීය තේමාව වන්නේ, මෙම අතිමහත් ඛේදවාචකය හමුවේ දේශපාලනය පසෙකට දැමිය යුතු බවත් අදාල න්‍යාය පත්‍රයන් නොතකා ව්‍යසනයෙන් දිවි ගලවා ගත්තවුන්ට පවතින ඕනෑම විධික්‍රමයකින් ආධාර ලබා දිය යුතු බවත් ය.

නිදසුනක් ලෙස, එල්ඩබ්ලිව් මෙසේ ප්‍රකාශ කරයිඃ “ගෝලීය කුහකත්වයන්, දේශපාලන ප්‍රශ්න සහ අඩුලුහුඩුකම් බොහොමයක් සත්‍ය විය හැකි වන අතර ම, අර්බුදයක දී මෙය අදාල නොවන අවස්ථාවක් උදා වේ. එක්සත් ජනපද හා සෙසු ජාත්‍යන්තර ආධාර වහාම භාර නොගැනීම මුලුමනින් ම කෲර සිතැත්තකුගේ වැඩකි. එයට මොන ම සමාවක් වත් දිය නොහැක. දර්ශනය අවශ්‍ය නැත. දේශපාලනය අවශ්‍ය නැත. එය කොහෙත් ම සමාවට කාරනාවක් නොවේ. එබැවින් ඔබගේ ලිපියේ සමස්ත සන්දර්භය ම මුලුමනින් ම වෛරී සහගත හා මුග්ධ එකකි. මෙය වනාහි මුලුමනින් ම මානුෂික හා කිසිවක් කර කියා ගත නොහැකි අවස්ථාවකි.”

එල්ඩබ්ලිව්ගේ වාග් ප්‍රහාරය ප්‍රකාශයට පත් කරන්නේ පොදු, තේරුම් ගත හැකි වන පවා, මනෝගතියකි. බුරුමයේ සිදු වන මානව දුක් වේදනාවන් නිසැකව ම හද කකියවන සුලු ය. දැනට මත් ජීවිත දස දහස් ගනනක් බිලි ගෙන ඇති අතිමහත් ඛේදවාචකයක් අප ඇස් ඉදිරියේ දිග හැරෙමින් පවතී. බොහෝ දෙනෙක් ආහාර, පිරිසිදු ජලය, ඖෂධ හෝ හිසට සෙවනක් නොමැතිව ලෙඩ රෝගවලින් හෝ සාගින්නෙන් වේදනා විඳ මිය යාමේ අවදානමට මුහුන දී සිටී. නිශ්චිතව ම, දේශපාලනයට වඩා මූලික මානුෂික ශිෂ්ඨත්වයට ප්‍රමුඛත්වය දී හැකි තරම් ඉක්මනින් විපතට පත් බොහෝ ජනයා වෙත ජීවත් වීම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පාදනය කල යුතු ය.

කෙසේ වෙතත්, ආරම්භයේ පටන් ම, ඉතා නිශ්චිත දේශපාලනයක් මෙම කාරනය සමග සම්බන්ධ වී තිබේ. එක්සත් ජනපදය හා එහි සගයන් හුදෙක් මානුෂික උත්සුකතා මගින් මෙහෙය වෙන්නේ නම්, බුරුම ආන්ඩුවට පිලිගත හැකි විධික්‍රම මගින් මුදල් හා ද්‍රව්‍යමය ආධාර සැපයීම ඔවුන්ට කල හැකිව තිබුනි. එහෙත් ආධාර යෝජනා නිශ්චිතව ම පැමින ඇත්තේ කොන්දේසි සහිතව ය. විදේශ නිලධාරින්ට, ආධාර විශේෂඥයන්ට හා මිලිටරි නිලධාරින්ට බුරුමයට හා සුලි සුලඟින් විපතට පත් ප්‍රදේශවලට “නිර්බාධිත ප්‍රවේශයක්” ලබා දිය යුතු ය යන ඉල්ලීම්වලට ජාත්‍යන්තර ආධාර ගැට ගසනු ලැබ තිබේ. තක්සේරු කිරීමේ, නිරීක්ෂනය කිරීමේ හා අධීක්ෂනය කිරීමේ කඩතුරාව යටතේ, මහ බලවතුන් තථ්‍ය ලෙස අවධාරනය කරන්නේ, ආධාර මෙහෙයුම් ඔවුන්ගේ පාලනයට යටත් කල යුතු බව යි.

එක්සත් ජනපද හා යුරෝපීය ආන්ඩු බුරුමයේ තන්ත්‍ර වෙනසක් පිලිබඳ සිය දිගු කාලීනව පවත්නා අභිලාෂයන් එලිපිට ම පාහේ ප්‍රකාශ කර ඇත. 1988 දී විපාර්ශ්වික වර්ජනවලට හා විරෝධතාවන්ට එරෙහි ජුන්ටාවේ ම්ලේච්ඡ මර්දන ව්‍යාපාරයට පසුව රාජ්‍යතාන්ත්‍රික, ආධාර හා අයෝජන සම්බාධක මුලින් ම පනවන ලද අතර එතැන් පටන් එම තහංචි අනවරතයෙන් දැඩි කරනු ලැබ ඇත. ඒවායේ අරමුන වී ඇත්තේ, අවුං සාන් සූ කීට හා ඇගේ විපාර්ශ්වික ජාතික ප්‍රජාතන්ත්‍ර සංගමයට (එන්එල්ඩී), එනම් බටහිර ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට වඩා

සහානුමතියක් දක්වන තන්ත්‍රයකට, බලය මාරු කරන ලෙස බුරුම මිලිටරියට බල කිරීම යි. දැන් මෙම බලවතුන්, ජාත්‍යන්තර මාධ්‍යවල අත්‍යසමාන උද්ඝෝෂන ව්‍යාපාරයක සහයෝගය ද ලැබ, බුරුමයේ මිලිටරි තන්ත්‍රයට තව දුරටත් වල කැපීමේ ප්‍රයෝජනවත් දේශපාලන ලීවරයක් ලෙස, බුරුම ජනතාව මුහුන දී සිටින ව්‍යසනය නරුම ලෙස ඩැහැ ගෙන තිබේ.

## ජාත්‍යන්තර ඛේදවාචක සහ මහ බලවතුන් වැඩ කරන විධිය

අපගේ විවේචකයන් මදකට නැවතී සැලකිල්ලට භාජන කල යුත්තේ, බුරුමයේ සුලි සුලඟින් විපතට පත් ජනයා වෙනුවෙන් කිඹුල් කඳුලු හෙලන මෙම ආන්ඩු ම, ලොව වටා දිනපතා සිදු වන අනේක විධ ඛේදවාචකයන් නිතිපතා නොතකා හරින්නේ මන් ද යන්න යි. පිම්මේ ඉහල නගින ආහාර මිල ගනන් මගින් සිය ජීවිත තර්ජනයට ලක් කෙරෙන ආසියාවේ, අප්‍රිකාවේ හා ලතින් ඇමරිකාවේ වෙසෙන මිලියන 100ක් යැයි තක්සේරු කෙරී ඇති ජනයාට ආධාර කරනු වස් උත්සුකතා ප්‍රකාශ කිරීමක් හෝ හදිසි කැඳවුම් ගැන අසන්ට ලැබෙන්නේ නැත. නැති නම්, සැම වසරක ම මැලේරියා වැලඳෙන කෝටි 50ක් පමන ජනයාට, මෙම පහසුවෙන් වලකා ගත හැකි රෝගයෙන් වාර්ෂිකව මිය යන වැඩි දෙනෙක් ලමුන් වන දශ ලක්ෂයක් පමන ජනයාට, ආධාර කිරීම ගැන අසන්නට ලැබෙන්නේ නැත.

අන් සියල්ලට මත් වඩා 2004 සුනාමියට ලෝක නායකයන්ගේ ආරම්භක ප්‍රතිචාරය කුමක් වී ද? ජීවිත 300,000කට වඩා බිලි ගත් ව්‍යසනය සම්බන්ධයෙන් ප්‍රකාශයක් නිකුත් කිරීමට පවා, එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ් සහ බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර් දින ගනනාවක් යන තෙක් ම, තමන් ගත කරමින් සිටි නිවාඩුව අත්හිටුවීම ප්‍රතික්ෂේප කලේ ය. විවිධ ලෝක නායකයන් මැදිහත් වීමට පෙලඹුනේ ලොව වටා ජනයාගෙන් සානුකම්පිත භාවයේ රැල්ලක් නැගී ඩොලර් මිලියන ගනනක ආධාර එකතු වීමෙන් පසුව පමනි. කෙසේ වෙතත්, ඔවුහු ස්වකීය අරමුනු උදෙසා ව්‍යසනය ගසාකෑමට වහාම හැරී ගත්හ. එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් ප්‍රකාශ කල පරිදි, ව්‍යසනය සිය හදවත ප්‍රදර්ශනය කිරීමට එක්සත් ජනපදයට "කදිම අවස්ථාවක්" සම්පාදනය කල අතර එය "අපට දැවැන්ත ප්‍රතිලාභ ලබා දුන්නේ ය". මානුෂික උත්සුකතාවයේ වෙස් මුහුනට මුවා වී, වොෂිංටනය ආසියාව තුල, විශේෂයෙන් ම ඉන්දුනීසියාවේ හා ශ්‍රී ලංකාවේ මිලිටරි සමග, සමීප මිලිටරි හා මූලෝපායික සබඳතා ගොඩනගා ගත්තේ ය.

බුරුම ජුන්ටාව හෙලා දැකීමේ සිය පිලිවෙතට ප්‍රතිකූල ලෙස, ජාත්‍යන්තර මාධ්‍ය, බොහෝ සෙයින්, ශ්‍රී ලංකා, ඉන්දියානු, ඉන්දුනීසියානු හා තායි ආන්ඩු විසින් විපතට පත් ජනයා සම්බන්ධයෙන් පෙන්නුම් කරන ලද නොහැකියාව හා මුලුමනින් ම නොතැකීම පිලිබඳව මුනිවත් රැක්කේ ය. ව්‍යසනයට පත් කලාපයට විදේශ හමුදාවන්ට ඇතුලුවීමට අවසර දීම සම්බන්ධයෙන් ඉන්දුනීසියානු ආන්ඩුව මග හරින භාවිතාවක යෙදී සිටි බැවින් අසේ පලාත ආක්‍රමනය කල යුතු යැයි කිසිවෙක් යොජනා කලේ නැත. නැති නම්, කොහෙත් ම ප්‍රමානවත් නැති එහි සහන මෙහෙයුම් කලමනාකරනය කරනු පිනිස ජාත්‍යන්තර ආධාර නිලධාරින්ට පැමිනීමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීම නිසා ඉන්දියානු ආන්ඩුව පෙරලා දැමිය යුතු යැයි ද කිසිවෙක් යෝජනා කලේ නැත.

යම් මානුෂික ව්‍යසනයක් හෝ ඒ වෙනුවට තවෙකක් ජාත්‍යන්තර පරීක්ෂාවට යටත් කල යුතු ද යන්න තීන්දු කෙරෙන්නේ දේශපාලන ගනන් බැලීම් අනුව ය. 1999 දී ලෝක මහජනතාවට පවසන ලද්දේ, යුගෝස්ලාවියාවට එරෙහි නැටෝ යුද්ධය ගෙන යන්නේ, සර්බියානු මිලිටරියෙන් හා සන්නද්ධ කන්ඩායම්වලින් ලක්ෂ සංඛ්‍යාත කොසෝවෝ සරනගතයන් ආරක්ෂා කර ගනු සඳහා බව යි. තථ්‍ය වසයෙන් ම, එකල *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පැහැදිලි කලේ, එක්සත් ජනපදයේ හා එහි සගයන්ගේ සැබෑ එල්ලයන් වන්නේ, බල ශක්ති සම්පත්වලින් පොහොසත් මධ්‍යම ආසියාව තුල සිය වඩා පුලුල් අභිලාෂයන් සපුරාගනු වස් බෝල්කන් කලාපයේ මෙහෙයුම් පදනමක් ස්ථාපිත කර ගැනීම බව යි. දශකයකට ආසන්න කලකට පසුව, කොසෝවෝ ප්‍රදේශය, ප්‍රධාන මිලිටරි කඳවුරු සහිත, තථ්‍ය සමාන නැටෝ ආරක්ෂිත වැයික්කියක් බවට පරිවර්තනය කෙරී ඇති අතර සර්බියානුවන් හා සෙසු සුලුතරයන් පලවා හැර "ජනවාර්ගිකව ශුද්ධ කෙරුනු" එහි ජනගහනය තවමත් ආර්ථික පසුගාමිත්වයේ ගිලී පවතී.

එම වසරේ දී ම, ඉන්දුනීසියානු-ගැති මැරයන්ගෙන් එහි ජනතාව ආරක්ෂා කර ගැනීමේ නාමයෙන් නැගෙනහිර ටිමෝරයට ඕස්ට්‍රේලියානු මිලිටරි මැදිහත්වීමක් යුක්තියුක්ත කරන අත්‍යසමාන ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කරන ලදි. කෙසේ වෙතත්, එහි ගාමකය නැගෙනහිර ටිමෝර වැසියන් පිලිබඳ මොන යම් හෝ උත්සුකතාවක් නම් නොවීය. එයට ප්‍රතිකූලව, 1998 දී ඉන්දුනීසියානු ආඥාදායක සුහර්තෝ බලයෙන් පහ කිරීම වටා වර්ධනය වූ නැගිටීම් මධ්‍යයේ, කැන්බරාවේ අධිෂ්ඨානය වූයේ සිය ප්‍රතිවාදීන්ට එරෙහිව නැගෙනහිර ටිමෝරයේ සිය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා, විශේෂයෙන් ම ටිමෝර් ගැප් ප්‍රදේශයේ තෙල් හා ගෑස් නිධි මත සිය ග්‍රහනය, ආරක්ෂා කර ගැනීම යි. 1999 පටන් ඕස්ට්‍රේලියාව බල ශක්ති සම්පත් බෙදා ගැනීම අරබයා ඩිලිහි නවක "ස්වාධීන්"

ආන්ඩුවට තර්ජනාත්මක බලපෑම් සිදු කොට ඇති අතර, 2006 දී, අගමැති මාරි අල්කටිරි බලයෙන් පහ කොට කැන්බරාවට වඩා වාසිදායක ආන්ඩුවක් පිහිටුවීමේ ක්‍රියාවලිය මෙහෙයවනු පිනිස එම කුඩා අර්ධ දිවයිනට යලිත් වරක් ඕස්ට්‍රේලියානු සොල්දාදුවෝ යවන ලදි. කොසෝවෝහි මෙන් ම, නැගෙනහිර ටිමෝරයේ ද ජනගහනයෙන් අති මහත් බහුතරයක් තවමත් අන්ත දරිද්‍රතාවයේ ගිලී සිටී.

බුරුමය තුල වොෂිංටනයේ අවශ්‍යතා කේන්ද්‍රගත වන්නේ, නැගී එන භූලෝපායික හා ආර්ථික ප්‍රතිවාදියකු ලෙස එය සලකන චීනය සමග එම රටට පවත්නා සමීප සබඳතා මත ය. ජුන්ටාවට එරෙහි බුෂ් පාලනාධිකාරයේ ප්‍රචාරක උද්ඝෝෂනය, ඊසාන දෙසින් ජපානයේ හා දකුනු කොරියාවේ පටන් බටහිරින් ඇෆ්ඝනිස්ථානය හා මධ්‍යම ආසියානු සමූහාන්ඩු දක්වා, චීනයේ දේශසීමාව වටා පුලුල් පරාසයක සගයන් හා පාදක මධ්‍යස්ථාන ගොඩනගා ගැනීමේ වඩා පුලුල් සැලසුමක කොටසකි. එමෙන් ම, තෙල් හා ගෑස් ඇතුලු සම්පත්වල සහ ලාභ ශ්‍රමයේ තවත් උල්පතක් ලෙස බුරුමය විවෘත කර ගැනීමට ද මහ බලවත්තු මාන බලති.

බුරුමයට ජාත්‍යන්තර ආධාර ඉල්ලා සිටින “මානුෂික” කැරොල් කරත්තයට නැග ගැනීමට ඉක්මන් වීමට පෙරාතුව, හරියට ම තමන් සහයෝගය දෙන්නේ කුමකට ද යන වග අපගේ විවේචකයන් වඩා පරෙස්සමින් සැලකිල්ලට භාජන කල යුතු ය. බෝල්කන් කලාපයේ හා නැගෙනහිර ටිමෝරයේ මැදිහත්වීම්වලට උඩ ගෙඩි දුන් හා ඒවාට අත්පොලසන් දුන් අය මෙන් ම ඔවුන්ට ද බුරුමයේ එවන් මැදිහත්වීමක ප්‍රතිඵල සම්බන්ධයෙන් දේශපාලන වගකීම දැරීමට සිදු වනු ඇත.

## මැනිචියානු උගුලක්

තවත් විවේචකයකු වන එල්ජ් මදක් වෙනස් මාවතක් ගනී. ඔහු වත්මන් මාධ්‍ය ප්‍රචාරක ව්‍යාපාරයට එක්වීම අප විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම බුරුම ජුන්ටාවට සහයෝගය දීමකට සම කරන්නේ මෙසේ පවසමිනි: “මාගේ සතුරාගේ සතුරා මාගේ මිතුරා බව ද එක්සත් ජනපදයේ මිලිටරි එල්ලයන් සමග අත්වැල් බැඳ ගැනීමකින් තොරව ජුන්ටාවට මොන යම් හෝ බලපෑම් දැමීමක් හෝ එය හෙලා දැකීමක් කල නොහැකි බව ද උපකල්පනය කරන මැනිචියානු උගුල තුලට ඇද නොවැටෙන ආකාරයේ ආස්ථානයක් බුරුමය සම්බන්ධයෙන් ගැනීමට ඔබගේ වාර්තා අසමත්ව ඇති බවක් පෙනේ.” මිලිටරි නොවන ආධාර හා මිලිටරි ආධාර අතර වෙනසක් පෙන්නුම් කිරීමට ප්‍රයත්න දරන ඔහු එම වෙනස මකා දැමීමට උත්සාහ කරන බවට *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* චෝදනා කොට ප්‍රශ්නයක ආකාරයෙන් මෙසේ යෝජනා කරයි: “රාජ්‍ය නොවන සංවිධානවලට හෝ මිලිටරි නොවන ආධාරවලට සිය දේශ සීමා විවෘත කරන ලෙස ඔවුන්ට (ජුන්ටාවට) බල කල නොහැකි ද?”

ප්‍රශ්නය වන්නේ: බලපෑම් දමන්නේ කවුරු විසින් ද කුමන ආකාරයෙන් ද? ප්‍රන්සය විසින් මෙහෙයවනු ලබන උද්ඝෝෂනය මිලිටරි හා මිලිටරි නොවන මැදිහත්වීමක් අතර වෙනසක් නොදකී. මානුෂික ආධාර පිලිගන්නා ලෙසත් ඔවුන් එය ප්‍රතික්ෂේප කල හොත් මහ බලවතුන්ගේ ඒක-පාර්ශ්වික ප්‍රතිචාරයකට මුහුන දීමට සිදු වන බවටත් ජුන්ටාවට බල කරනු පිනිස එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය සිය “ආරක්ෂා කිරීමේ වගකීම්” නමැති බලතල යොදා ගත යුතු බවට මුලින් ම යෝජනා කලේ ප්‍රන්ස විදේශ ඇමති බර්නාඩ් කච්නර් ය. එම තර්ජනයට පිටුබලය සපයනු වස්, ප්‍රන්සය, බ්‍රිතාන්‍යය සහ එක්සත් ජනපදය බුරුමයට නුදුරු මුහුදට සිය යුද නැව් එවී ය. බුරුම තන්ත්‍රයේ අවසරය ඇතිව හෝ නැතිව ඉරවඩී ඩෙල්ටා ප්‍රදේශයට ගුවනින් ආධාර හෙලීමේ අදහස බුෂ් පාලනාධිකාරය ඉදිරියට දමා ඇත.

එල්ජ්ට අනුව, එක්සත් ජනපදයේ හා එහි සගයන්ගේ සැලසුම්වලට විරුද්ධ වීම මගින් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* බුරුම ජුන්ටාවට සහයෝගය දීමේ වරදට හසු වේ. මෙය වනාහි, අධිරාජ්‍යවාදයේ හා එහි කොල්ලකාරී ක්‍රියාවන්ගේ විරුද්ධවාදීන්ට මඩ ගසනු පිනිස දශක ගනනාවක් තිස්සේ පට්ටා ගසනු ගනු ලැබූ තර්කය යි. එම ආස්ථානයේ පදනම මත, 1999 දී ටිමෝරයට සිදු කල ඕස්ට්‍රේලියානු මැදිහත්වීමට විරුද්ධ වූ ඕනෑම අයෙකුට ඉන්දුනීසියානු-ගැති සන්නද්ධ කන්ඩායම් විසින් සිදු කරනු ලැබූ ප්‍රචන්ඩ ක්‍රියාවන්ට සහයෝගය දෙන බවට චෝදනා කරන ලදි. යුගෝස්ලාවියාවට එරෙහි නැටෝ යුද්ධයේ විරුද්ධවාදීහු මිලොසොවික් තන්ත්‍රයට පිටුබලය සපයන්නෝ ය. ඉරාක ආක්‍රමනය සම්බන්ධයෙන් ගත හොත්, බුෂ් පාලනාධිකාරයේ සාපරාධී යුද්ධයේ ඕනෑම විරුද්ධවාදියෙක් සදාම් හුසේන්ගේ රැවටීම්වලට හසු වූ අයෙක් විය යුතු ය.

එවන් ගුනාංගීකරනයන් පදනම් කෙරෙන්නේ, කම්කරු පන්තිය ස්වාධීන දේශපාලන ආස්ථානයක් ගැනීමට කිසිදාක සමත් වන්නේ නැත යන උපකල්පනය මත ය. අපගේ විවේචකයන් සුලි සුලගින් විපතට පත් ලක්ෂ සංඛ්‍යාත බුරුම වාසීන් මුහුන දෙන අති මහත් දුක් වේදනාවන් සම්බන්ධයෙන් අවධානය යොමු කරන නමුත්, ස්වකීය පන්ති අවශ්‍යතා උදෙසා සටන් වැදීමෙහි ලා මැදිහත්වීමට සමත් ස්වාධීන සමාජ බලවේගයක් ලෙස බුරුමයේ වැඩ කරන ජනතාවගේ වර්ධනය සංකල්පනය කර ගැනීමට ඔවුහු අසමත් වෙති. ආර්ථික

වසයෙන් පසුගාමී රටවල දරිද්‍රතාවයෙන් බැට කන කම්කරුවන් හා ගොවීන් සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ, ස්වකීය අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කල හැකි දේශපාලන ක්‍රියාකාරීන් ලෙස නොව, අනුකම්පාවට භාජන වීමට සුදුසු අක්‍රීය වස්තූන් ලෙස ය.

එලෙස ම "අයථා" ලෙස සලකා නොතකා හැර ඇත්තේ, ජාත්‍යන්තර කම්කරු පන්තියේ, එනම් බුරුම ජනතාව සැබැවින් ම විමුක්ත කර ගැනීමට සමත් එකම සමාජ බලවේගයේ, මැදිහත්වීම යි. බුරුම ජනතාවගේ දරිද්‍රතාවට හා පීඩනයට හේතු වී ඇත්තේ, අවසාන විග්‍රහයේ දී, හුදු වත්මන් ජුන්ටාව නොව, ශත වර්ෂයකට වැඩි කලක් තිස්සේ පැවති විජිත ආධිපත්‍යය සහ දැන් යලි එම රටට අඩිය ගසා ගැනීමට මාන බලන එම යුරෝපීය හා ඇමරිකානු බලවතුන් විසින් ම ඉන් පසුව පවත්වා ගෙන විත් ඇති අධිරාජ්‍යවාදී සූරාකෑම යි.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය*, බුරුම ජුන්ටාව අහෝසි කිරීමට නොපැකිලිව ම පක්ෂපාතී ය. එහෙත් එය සිදු කෙරෙන්නේ කෙලෙස ද ජුන්ටාව විස්ථාපනය කෙරෙන්නේ කුමකින් ද යන ප්‍රශ්නවලට අපි අසංවේදී නොවෙමු. එක්සත් ජනපදය හා එහි සගයන් කැමති විකල්පය වන සු කී හා ඇයගේ එන්එල්ඩීය බලයට පත් කිරීම, කම්කරුවන් හා ගම්බද දුගීන් වෙනුවෙන් තැබෙන ඉදිරි පියවරක් නොවනු ඇත. එන්එල්ඩී නියෝජනය කරන්නේ, "ප්‍රජාතන්ත්‍රවාදයේ" නාමයෙන් බුරුමය විදේශ ප්‍රාග්ධනයට විවෘත කිරීමට මාන බලන බුරුම ධනේශ්වරයේ ස්ථරයකි. රට නව ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කිරීම, බුරුම ජනතාව මුහුන දෙන ආර්ථක හා සමාජ අර්බුදය විසඳලනවා නොව, ඒ වෙනුවට ධනවතුන් හා දුගීන් අතර සමාජ පරතරය නොවැලැක්විය හැකි ලෙස ගැඹුරු කරනවා ඇත.

එන්එල්ඩීය ජුන්ටාවට එරෙහිව තරුන ජනයා, කම්කරුවන් හා ගොවීන් බලමුලු ගැන්වීමට අතිශයින් ම ප්‍රතිරෝධය දක්වා ඇත්තේ, එවන් ව්‍යාපාරයක් පැන නැගි සෑම අවස්ථාවක ම දේශපාලන තිරිංගයක් ලෙස ක්‍රියා කිරීම මගිනි. 1988 දී, ජුන්ටාව දන ගැස්වූ පුලුල් වර්ජන හා විරෝධතා මධ්‍යයේ, සු කී, වසර දෙකකට පසු මැතිවරන පැවැත්වීමේ පොරොන්දුවකට හිලව් වසයෙන් නැගිටීම අවසන් කිරීමේ එකගතාවක් පිලිගැනීම මගින් ජෙනරාල්වරුන් ගලවා ගත්තා ය. තත්වයේ පාලනය යලි සියතට ගැනීමෙන් අනතුරුව, ජුන්ටාව මැතිවරන ප්‍රතිඵල නොතකා හැර එන්එල්ඩී නායකත්වය සිරගත කලේ ය.

පසුගිය සැප්තැම්බරයේ දී, ජුන්ටාවට, මිල සහනාධාර ඉවත් කිරීමේ එහි පියවරයන්ට හා එහි ප්‍රජාතන්ත්‍ර විරෝධී විධි ක්‍රමවලට විරුද්ධත්වය දක්වනු පිනිස දස දහස් සංඛ්‍යාත බුරුම වැසියෝ වීදිවලට ගලා ආහ. එහෙත් එන්එල්ඩීය ක්‍රියා කලේ 1988 පුලුල් වර්ජන ව්‍යාපාරයේ මොන යම් හෝ පුනර්කරනය වීමක් වලකනු පිනිස ය. එන්එල්ඩීයේ ඉල්ලීම් ප්‍රකාශයට පත් කෙරුනේ, සීමිත ප්‍රතිසංස්කරන පතා බුරුම මිලිටරිය වෙත කෙරුනු කීකරු ආයාචනා ලෙස ය. ජුන්ටාවට බලපෑම් දමනු පිනිස විරෝධතා ව්‍යාපාර ගසාකන අතර ම, එන්එල්ඩීය, ධනපති පාලනයට තර්ජනයට කරනු ඇති මොන යම් හෝ නැගිටීමේ ව්‍යාපාරයක් සම්බන්ධයෙන්, ජෙනරාල්වරු තරමට ම, භීතියට පත්ව සිටී.

අද, තමන් වෙනුවෙන් මැදිහත් වන ලෙස එන්එල්ඩීය ආයාචනා කරන්නේ බුරුම ජනතාවට නොව, "ජාත්‍යන්තර ප්‍රජාවට" යි. මැයි 10 දා නිකුත් කෙරුනු ප්‍රකාශයක් මෙසේ සඳහන් කරයි: "අපි, මහජනතාවගේ ජනවරම ලද, ජාතික ප්‍රජාතන්ත්‍ර සංගමය, එක්සත් ජාතීන් ඇතුලු ජාත්‍යන්තර ප්‍රජාවගෙන් යලිත් වරක් ඉල්ලා සිටින්නේ, බුරුමයට විශේෂඥයන් හා මානුෂික ආධාර එවීමත් එරට තුල සහන හා ගලවා ගැනීමේ මෙහෙයුම් ආරම්භ කිරීමත් පිනිස හැකි සියලුම විධි ක්‍රම වහාම යොදා ගන්නා ලෙස යි." විදේශ මිලිටරි හමුදා ඇතුලු "හැකි සියලුම විධි ක්‍රම" යොදා ගැනීම බලය උදෙසා වන ස්වකීය ප්‍රයත්නය සඳහා වඩා හිතකර වාතාවරනයක් නිර්මානය කරනු ඇතැයි එන්එල්ඩීය පැහැදිලිව ම බලාපොරොත්තු වේ.

තමන්ට බලයට නැග ගැනීමට උදව් කරන ලෙස "ජාත්‍යන්තර ප්‍රජාවට" ආයාචනා කරනු පිනිස සාමාන්‍ය ජනතාවගේ ඉරනම විරුද්ධ පක්ෂයක් විසින් ගසා කනු ලැබූ ප්‍රථම අවස්ථාව මෙය නොවේ. 1999 දී, නැගෙනහිර ටිමෝරයේ ක්ෂනානා ගුස්මාවෝ හා ජෝස් රමෝස් හෝර්ටා නායකත්වය, ඉන්දුනීසියානු-ගැති සන්නද්ධ කන්ඩායම් නිදහස් ආධාරකරුවන්ට එරෙහිව නිදැල්ලේ ප්‍රහාර එල්ල කරද්දී, තමන්ගේ ෆැලැන්තිල් සටන්කරුවන්ට ඔවුන්ගේ බැරැක්ක තුල රැදී සිටින ලෙස අවධාරනය කල අතර, ඉන් අනතුරුව, විදේශ මිලිටරි මැදිහත්වීමක්, ජාත්‍යන්තර ආධාර සහ ස්වකීය දේශපාලන අභිලාෂයන් උදෙසා පිටුබලය ලබා ගනු වස් ආයාචනා කරනු පිනිස එම ප්‍රචන්ඩ ප්‍රහාර යොදා ගත්තේ ය.

බුරුමයේ වත්මන් ඛේදවාචකයට සරල හෝ ඉක්මන් විසඳුම් නොමැත. ජුන්ටාව වත් මහ බලවතුන් වත් එය විසඳලීමට සමත් නොවනු ඇත. එයට ආමන්ත්‍රනය කරනු හැකි වන්නේ, අධිරාජ්‍යවාදය පෙරලා දමා, සංගතවල ලාභ අවශ්‍යතා නොව මානුෂික අවශ්‍යතා සපුරාලනු පිනිස සමාජය පරිවර්තනය කිරීමේ එල්ලය සහිත, ජාත්‍යන්තර කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක මැදිහත්වීම මගින් ම පමනි.

මහ බලවතුන්ගේ ඕනෑම මැදිහත්වීමක් නව හා වඩා භයංකර ව්‍යසනයන් සඳහා වේදිකාව සකසනු ඇත.

## සමාජවාදයට බොරු ආලයක් පෑම

අප වෙත ලිපියක් එවූ තවත් අයකු වන ටීආර් මෙසේ ප්‍රකාශ කලේ යඃ "එසේ නම් ඔබ සිතන්නේ, බුරුම ආන්ඩුවේ මෘගත්වය පිලිබඳ ඔබගේ අටුවාවන්, ඔබ හුදෙක් සමාජවාදයට බොරු ආලයක් දක්වන්නේ ය යන පැහැදිලි කරුනට එදිරිව ඔබව ආරක්ෂා කරනු ඇත කියා ය. බටහිර ජාතීන් බුරුමයට ආධාර එවීම සම්බන්ධයෙන් ඔබ දක්වන උත්සුකතාව වන්නේ, අසාර්ථක වූ සමාජවාදී අත්හදා බැලීමක ව්‍යසනයෙන් එය යලිත් වරක් ගලවා ගනු වස් ධනවාදී මැදිහත්වීමක් එයින් අදහස් කෙරෙනු ඇත යන්න ය. ඉතින් ඔබගේ උත්සුකතාව වන්නේ, එවැන්නක් සිදු වීමට ඉඩ දෙනවාට වඩා බුරුමයේ ජනතාව සාගින්නෙන් මිය යනු දැකීමට ඔබ කැමතිව සිටින තතු තුල, ධනවාදය බුරුමය තුල පාරුකුලක් ලබා ගැනීමට සමත් වනු ඇත යන්න යි." පොදුවේ සමාජවාදයටත් විශේෂයෙන් ම කාල් මාක්ස්ටත් එරෙහි ප්‍රති-කොමියුනිස්ට්වාදී වාග් ප්‍රහාරවල ටීආර් දිගට ම යෙදී ගනී.

පලමු කොටම, බුරුමය යනු "අසාර්ථක වූ සමාජවාදී අත්හදා බැලීමක්" නොවේ. එය වනාහි, ඊනියා තුන් වන ලෝකයේ රටවල 1950 ගනන් හා 1960 ගනන්වල දී දුලභ දෙයක් නොවූ අතිශයින් ම පරිපාලිත හා ආරක්ෂිත ධනවාදී රූපාකාරයන් පිලිබඳ තවමත් ඉතිරිව පවත්නා අතලොස්සක් වූ නිදසුන්වලින් එකකි. 1962 දී පිහිටුවන ලද බුරුම ජුන්ටාවට කිසිදාක සමාජවාදය සමග කිසිදු සබඳතාවක් තිබුනේ නැත. එකල සිටි සෙසු ජාතිකවාදී නායකයන් බොහොමයක් මෙන්, මහජනතාවට ආයාචනා කරනු පිනිස, සිය පිලිවෙත් "සමාජවාදයට බුරුම මාවත" ලෙස වෙස් ගන්වා ගැනීමට ජෙනරාල් නේ වින්ට බල කෙරුනි. එමෙන් ම, ඔහු කම්කරු පන්තියෙන්, විවිධ ජනවාර්ගික සුලුතරයන්ගෙන් හා ස්ටැලින්වාදී බුරුම කොමියුනිස්ට් පක්ෂයේ කන්ඩායම්වලින් පැන නැගුනු ඕනෑම විරුද්ධත්වයක් රුදුරු ලෙස මර්දනය කලේ ය.

"සමාජවාදයට බොරු ආලයක් දැක්වීම" සම්බන්ධයෙන් ගත හොත්, සිය දේශපාලන දිශාවනිතිය වහංගු කර ගැනීම පිලිබඳ චෝදනාව නම් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* එල්ල කල නොහැකි ය. ලෝකයේ සෑම කොටසක ම ජාත්‍යන්තර සමාජවාදය සඳහා අරගලය වෙනුවෙන් අපි විවෘතව ම පෙනී සිටිමු. සුලි සුලං, භූමිකම්පා සහ සුනාමි ස්වාභාවික සිද්ධීන් වන අතර ම, ඒවා සිදු කරන ව්‍යසනය වනාහි ලෝක ජනගහනයේ අති මහත් බහුතරයේ අවශ්‍යතාවන්ට ඉදිරියෙන් ලාභ හා වරප්‍රසාද තබන සමාජ ක්‍රමයක ප්‍රතිඵල ය. බුරුම ආර්ථිකයේ පවත්නා අතිශය පසුගාමිත්වය ම, ධනවාදී ලාභ ගරන පද්ධතියේ ද ලෝකය වටා කම්කරුවන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහලට තල්ලු කරනු පිනිස දැවැන්ත ලාභ ශ්‍රම අතිරේක හමුදාවක් පවත්වා ගෙන යාමට එයට ඇති අවශ්‍යතාවයේ ද සෘජු ප්‍රතිඵලය යි.

ලෝක සමාජවාදය උදෙසා අරගලයට යම් වඩා පහසු විකල්පයක් පවතින බව විශ්වාස කරන අය විසි වන සියවසේ ඉතිහාසය පිලිබඳව බැරෑරුම් අධ්‍යයනයක් කල යුතු ය. කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය දේශපාලන වාසිය වෙනුවෙන් පාවා දී බලයේ සිටින පාර්ශ්වයන්ට අනුගත වූ දේශපාලන පක්ෂ, වැඩපිලිවෙලවල් හා නායකත්වයන් විසින් නිර්මානය කරන ලද ව්‍යසනයන්ගෙන් එම ඉතිහාසය පිරී ඇත. අවස්ථාවාදයේ සියලු රූපාකාරයන්ට එරෙහිව ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ගෙන ගිය අරගලය තුල දේහානුරූපව පවත්නා එම ඉතිහාසයේ දේශපාලන පාඩම්, අව්‍යාජ සමාවාදය පුනර්ජීවනය කිරීම සඳහා පදනම සැකසිය යුතු ය. බුරුමයේ ව්‍යසනය ගැන උත්සුක වන තරුන ජනයා, ශිෂ්‍යයන් හා සියලු වැඩ කරන ජනතාව හැරිය යුත්තේ, නිසැකව ම මෙම ව්‍යාපාරය වෙත ය.

© www.wsws.org